Australian Government

# වර්ගවාදය පිළිගත නොහැක

වාර්ගික පදනම මත වෙනසකට ලක් කිරීම, හිරිහැර කිරීම හෝ වෛර කිරීම ඔබ දකිනම් හෝ අත්විඳියි නම්, එය විඳදරා නොසිටින්න, එයට එරෙහිව පැහැදිලිව කථා කරන්න

**ඔබ වර්ගවාදී හැසිරීමකට ගොදුරුවී ඇතිනම්**

- ඔබට පහරදී ඇතිනම් හෝ හිංසා කරන බවට තර්ජනයක් ඇතිනම්, පොලීසිය හා සම්බන්ධවන්න.
    - ආපදා අවස්ථාවකදී හෝ ජීවිත තර්ජනක් ඇති අවස්ථාවකදී, බිංදු තුන (000) අමතා පොලීසිය ඉල්ලා සිටින්න.
    - ඔබට පොලීසියේ උපකාර අවශ්‍යමුත් ක්ෂණික අවදානමක් නැතිනම්, පොලිස් උපකාර අංකය (Police Assistance Line) අමතන්න (131 444).
- හිංසනයක් සිදුවී නැතිනම්, අදාල පුද්ගලයා සහ පුද්ගලයන් සමග ඍජුවම කරුණ සාකච්ඡාකර කටයුතු කිරීමට තීරණය කල හැකිය. එසේ කල යුත්තේ එසේ කිරීම ආරක්ෂාකාරීනම් පමණි.
- එසේ ඍජුවම කථාකර තත්වය විසඳුනේ නැතිනම්, හෝ එසේ කථා කිරීමට ඔබ අසතුටුනම්, ඔබ වසින් ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම (Australian Human Rights Commission (AHRC)) වෙත පැමිණිල්ලක් ඉදිරිපත්කල හැකිය.
    - AHRC වෙත පැමිණිල්ලක් යොමු කිරීම සඳහා, www.humanrights.gov.au/complaints වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම්, දුරකථන අංක 1300 656 419 හෝ 02 9284 9888 ඔස්සේ AHRC හි ජාතික තොරතුරු සේවාව (National Information Service) අමතන්න.

**බලා සිටින අය සතුව ඇති බලය**

වර්ගවාදයට සාක්ෂි දරණ අය එයට විරුද්ධව පැහැදිලිව කථා කරන විට, එයට ගොදුරුවන අය හට උපකාර ලැබෙන බවට හැඟීමක් ඇතිවේ, එසේම, වර්ගවාදී ආකාරයට හැසිරෙන අය සිය හැසිරීම සම්බන්ධයෙන් නැවත සලකා බැලිය හැකිය. ඔබට අවදානමක් ඇතිවන ආකාරයට කටයුතු නොකරන්න. කෙසේවුවද, ආරක්ෂාකාරීනම්, පැහැදිලිව කථාකාර ගොදුරුවූ අය සමග සිටින්න. ඉතා කුඩා ඉඟියක් වුවද, බලවත් විය හැකිය.

ඔබ වර්ගවාදී හැසිරීම දකිනම්, ඔබ විසින් පහත දේ කල හැකියඃ

- පැහැදිලිව කථා කරන්න - එය වර්ගවාදය ලෙස හඳුන්වන්න, එය පිළිගත නොහැකි බව එම වරද කරන අය හට දැනුම් දෙන්න
- ගොදුරුවූ අය හට සහයෝගය ලබා දෙන්න - ගොදුරුවූ අය ලඟ සිටගෙන ඔවුන්ගේ සුවදුක් විමසන්න
- සාක්ෂි ලබා ගන්න - සිද්ධිය ඔබ ජංගම දුරකථනයේ වාර්තාකර ගන්න, වරද කරන අයගේ ඡායාරූපයක් ගෙන බලධාරීන් වෙත වාර්ත කරන්න

බලා සිටින අය සඳහා ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම වෙතින් ලබාදෙන හෝඩුවාවන් ඇත. https://itstopswithme.humanrights.gov.au/respond-racism වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## වාර්ගික පදනමින් වෙනසකට ලක්කිරීම සහ ඔබගේ අයිතිවාසිකම්

ඕස්ට්‍රේලියාව තුල ජාතිය, වර්ණය, ජාතිකත්වය, හෝ වාර්ගික සම්භවය පදනම් කරගෙන පුද්ගලයෙකු හෝ මිනිසුන් කණ්ඩායමක් හට **තරහා ඇති කරන, අවමාන කරන, ලැජ්ජා කරන හෝ භය කරන** ආකාරයේ කිසියම් දෙයක් සිදු කිරීම නීතියට පටහැනිවේ. මේ ආකාරයේ හැසිරීම වාර්ගික වෛරීයභාවය ලෙස වර්ගීකරණය කෙරේ.

වාර්ගීය වෛරීභාවයට උදාහරණ ඇතුලත්වේ:

- අන්තර්ජාලයේ ඇති ෆෝරම්, බ්ලොග්, සමාජ ජාල සහ වීඩියෝ හුවමාරු කර ගැනීමේ අඩවිවල ඇති වාර්ගීය වශයෙන් තරහා ඇති කරන දේ
- පුවත්පතක, සඟරාවක හෝ පත්‍රිකා ආදී වෙනත් ප්‍රකාශනවල ඇති වාර්ගික වශයෙන් තරහා ඇති කරන, අදහස් හෝ රූප
- ප්‍රසිද්ධ රැළියක සිදු කරන තරහා ඇති කරන කථා
- කඩ සාප්පුවක, රාජකාරී ස්ථානයේ, පොදු ප්‍රවාහනවල හෝ පාසලක වැනි පොදු ස්ථානයක සිදුකරන වාර්ගික වශයෙන් කරන අපවාදාත්මකව ප්‍රකාශ කරන අදහස්
- ක්‍රීඩකයන්, ප්‍රේක්ෂකයන්, පුහුණුකරුවන් හෝ බලධාරීන් විසින් කරන අපවාදාත්මකව ප්‍රකාශ කරන අදහස්

නීතියේ අපේක්ෂාව වන්නේ නිදහසේ සන්නිවේදනය කිරීම (‘භාෂණයේ නිදහස’) සහ වාර්ගීය ද්වේශයෙන් තොරව ජීවත්වීම අතර සමබරතාවයක් ඇතිකිරීමවේ. සමහර අවස්ථානුගත කරුණුවලදී, යම් ක්‍රියා “සාධාරණ ආකාරයට සහ සද්භාවයෙන් කරන්නේ නම්”, නීතියට පටහැනි නොවිය හැකිය.

සමාන අවස්ථාවක සිය වාර්ගිකබව, වර්ණය, සම්භවය, ජාතිය හෝ වාර්ගික සම්භවය හේතුවෙන් හෝ සංක්‍රමණ තත්වය හේතුවෙන් වෙනත් අයෙකුට වඩා අඩු ආකාරට ඔබට සලකන අවස්ථාවලදීද, වාර්ගික ආකාරයට වෙනසකට ලක්කිරීම සිදුවේ. උදාහරණ වශයෙන් යම් අයෙකු යම්කිසි වාර්ගික පසුබිමකට අයත් හෝ සමෙහි වර්ණය හේතුවෙන් නිවසක් කුලියට දීම ප්‍රතික්ෂේප කිරීම.

සියළුම අය සඳහා රීතියක් හෝ ප්‍රතිපත්තියක් ඇති අවස්ථාවක ඔබගේ වාර්ගිකබව, වර්ණය, සම්භවය, ජාතිය හෝ වාර්ගික සම්භවය හේතුවෙන් හෝ සංක්‍රමණ තත්වය හේතුවෙන් අසාධාරණ බලපෑමක් සිදුවන අවස්ථාවලදීද, වාර්ගික ආකාරයට වෙනසකට ලක්කිරීම සිදුවේ. උදාහරණ වශයෙන් සමාගමක් මගින් සේවකයන් විසින් හිස්වැසුම් හෝ වෙනත් හිස් පලඳනා රාජකාරී කරන අවස්ථාවල නොපැළඳිය යුතුය පවසන අවස්ථාවක සමහර ජාතික/වාර්ගික පසුබිම්වලින් පැමිණෙන අය හට අසාධාරණ ආකාරයට බලපෑමක් සිදුවිය හැකිය.

ඔබ විසින් වාර්ගික ද්වේශය අත්දකීනම්, ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය. පැමිණිලි ක්‍රියාවලිය නොමිළේ වන අතර සරල සහ සුනම්‍යවේ.

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, www.humanrights.gov.au/complaints.

## ජාතික තොරතුරු සේවාව

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසමේ ජාතික තොරතුරු සේවාව (National Information Service (NIS)) මගින් පුද්ගලයන්, සංවිධාන සහ සේවායෝජකයන් හට මානව හිමිකම් සහ වෙනසකට ලක් කිරීම සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් පුළුල් පරාසයක තොරතුරු ලබාදෙන අතර යොමුකිරීම්ද සිදු කෙරේ. මෙම සේවාව නොමිලේ වන අතර රහසිගතය.

NIS වෙතින් පහත දේ කල හැකිය:

- ෆෙඩරල් නීතිය යටතේ මානව හිමිකම් සහ වෙනසකට ලක්කිරීමට එරෙහි නීති සම්බන්ධ ඔබට ඇති අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධ තොරතුරු ඔබට ලබාදිය හැකිය.
- ඔබ විසින් කොමසාරිස්වරයා වෙත පැමිණිල්ලක් යොමුකල හැකිද යන්න සහ ඔබගේ තත්වයේදී නීතිය කෙසේ අදාලවේද යන්න සාකච්ඡා කිරීම
- පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ කෙසේද, පැමිණිල්ලකට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද හෝ නිශ්චිත වෙනසකට ලක්කිරීම සම්බන්ධ ගැටළු සම්බන්ධ තොරතුරු ඔබට ලබාදීම
- ඔබ හට උපකාර කල හැකි වෙනත් සංවිධානයකට ඔබව යොමුකිරීම

NIS වෙතින් නීති උපදෙස් ලබාදිය නොහැකි බව කරුණාවෙන් සලකන්න.

පහත ආකාරයට ඔබ විසින් NIS හා සම්බන්ධවිය හැකිය:

- දුරකථනය: 1300 656 419 හෝ 02 9284 9888
- ඊමේල්: infoservice@humanrights.gov.au
- ෆැක්ස්: 02 9284 9611
- ජාතික රිලේ සේවාව: 1300 555 727 (කථා කරන්න සහ සවන් දෙන්න) හෝ internet-relay.nrscall.gov.au

**භාෂා සහ භාෂණ පරිවර්තන සේවාව**

භාෂා සහ භාෂණ පරිවර්තන සේවාව (Translating and Interpreting Service (TIS National)) යනු ඉංග්‍රීසි කථා නොකරන අය සඳහාවූ භාෂණ පරිවර්තන සේවාවකි. බහුතරයක් TIS National සේවා ඉංග්‍රීසි කථා නොකරන අයහට නොමිලේ ලබාදෙන සේවාවකි.

- දුරකථන: 131 450
- පිවිසෙන්න: www.tisnational.gov.au

**උපදේශක සේවා සහ මානසික සෞඛ්‍යය සුබසාධනය**

කෝවිඩ්-19 වසංගත කාලයේදී මිනිසුන් හට විශේෂයෙන් උපකාර කිරීම සඳහා සැලසුම් කල දින 7 පුරාත් පැය 24 පුරාත් ඕස්ට්‍රේලියානුවන් හට නොමිලේ ලබාගත හැකි නව උපකාර සේවාවකි.

උපකාර සේවාව මෙම වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකිය https://coronavirus.beyondblue.org.au/

පුද්ගලික අර්බුද සහ මානසික සෞඛ්‍යය උපකාර සේවා සඳහා ඔබ විසින් ඕනෑම අවස්ථාවක දුරකථන අංක 1800 512 348 ඔස්සේ බියොන්ඩ් බ්ලූ හෝ දුරකථන අංක 13 11 14 ඔස්සේ ලයිෆ්ලයින් ඇමතිය හැකිය.

කිඩ්ස් හෙල්ප්ලයින් යනු වයස අවුරුදු 5 සිට 25 අතර අය සඳහා නොමිලේ ලබාගත හැකි සේවාවකි. කුඩා දරුවන්, තරුණයන් සහ බාල වැඩිහිටියන් විසින් ඕනෑම අවස්ථාවක දුරකථන අංක 1800 551 800 ඇමතිය හැකිය.